# ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව වයස්ගත වීම තුළින් ඇතිවන ආර්ථික ප්‍රතිවිපාක

එච්.ආර්.අනුලාවතී මැණිකේ

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති (ආර්ථික විද්‍යා) උපාධි පරීක්ෂණයේ පාර්ශ්වීය අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

ලියාපදිංචි අංකය : A 16735

විභාග අංකය : S.P.A. 410

149795

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

1998

# 6 පරිච්ඡේදය

## සාරාංශය, නිගමන හා යෝජනා

### 6.1 සාරාංශය

රටක ළමා හා තරුණ පරපුර මෙන්ම වැඩිහිටි පරපුරද එරටට සම්පතක් වෙයි. බොහෝ දියුණු රටවල් මේ සම්බන්ධයෙන් සැලකිල්ලට ගෙන ක්‍රියා කරන ආකාරය දැකිය හැකිය. ලෝකයේ ජනගහනය තුළ වයස්ගත පුද්ගලයින්ගේ ප්‍රතිශතය වැඩිවෙමින් පවතින තත්ත්වයක් යටතේ වයස්ගත වූවන් ආශ්‍රිතව පැනනගින සංකීර්ණ ගැටළු පිළිබඳ ලොව සියළු දෙනාගේ ක්ෂණික අවධානය යොමු විය යුතුව ඇති අතර එවැනි අවධානයක් තුළින් මෙම තත්ත්වයට මුහුණ දීම සඳහා කාලීන වැඩ සැලැස්මක් සකස් කිරීම යුගයේ අවශ්‍යතාවය වී ඇත. මෙවැනි කාලීන වැඩ සැලසුම් සාර්ථකව මෙහෙයවිය හැක්කේ වයස්ගත වූවන් පවුලට, ආර්ථිකයට හා සමාජයට ගැටළුවක් වන ආකාරය හඳුනා ගැනීම තුළිනි. මෙම අධ්‍යයනයද එවැනි කාලීන අවශ්‍යතාවක් ඉටු කිරීමට දැරූ ප්‍රයත්නයක් ලෙස හැඳින්විය හැක. එහිදී මූලික අවධානය යොමු කරනු ලැබුවේ වයස්ගත පරපුර ආර්ථිකය කෙරෙහි බලපාන ආකාරය සොයා බැලීම පිණිසයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ වයස්ගත ජන සංඛ්‍යාව ආශ්‍රිතව ඇතිවන ආර්ථික ගැටළු මොනවාද යන්න ග්‍රාමීය හා නාගරික මට්ටමෙන් ඇගයීමක් කරනු ලැබීය. එහිදී සාකච්ඡාවට භාජනය වූ කරුණු හා ඒ අනුව එළඹුනු නිගමන සමාලෝචනය කිරීමටත් වයඝ්ගත ජන සංඛ්‍යාව තුළින් මතුවන ආර්ථික ගැටළු අවම කිරීම උදෙසා ගතයුතු ක්‍රියා මාර්ගයන් හා ඊට අදාල යෝජනා ඉදිරිපත් කිරිමටත් මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කෙරේ.

දෙවන ලෝක යුද්ධයට පසු කාලීනව මර්තයතාවයේ ඇති වූ සීඝ්‍ර පහත වැටීමත් 1960 ගණන්වලින් පසු ඇති වූ සාඵල්‍යතාවයේ සීඝ්‍ර අඩුවීමත් නිසා 1946 පැවැති තත්ත්වයට සාපේක්ෂව වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ වයස්ගත ජන සංඛ්‍යාව වේගයෙන් වර්ධනය වීමක් දැකිය හැකිය. එය අන් කිසිදු රටක සිදුනොවූ ආකාරයෙන් වේගවත් වී ඇති බව පැවසේ. අඩු ආර්ථික සංවර්ධනයක් යටතේ වයස්ගත ජන සංඛ්‍යාවේ සිදුවන මෙම වර්ධනය ශ්‍රී ලංකාවට දැරිය

නොහැකි බරකි. විශේෂයෙන් වේගවත්ව විපර්යාසයට භාජනය වෙමින් පවතින වර්තමාන සමාජ, ආර්ථික හා දේශපාලන පසුබිම යටතේ වයස්ගත වූවන්ගේ ප්‍රශ්නය සමාජීය හා ආර්ථික වශයෙන් විවිධ ගැටළු ඇති කිරීමට හේතුවන බැවින් ඒ පිළිබඳ අධ්‍යයනයක යෙදීම කාලීන වශයෙන් වැදගත් වන බව පළමු පරිච්ඡේදයේදි පෙන්වා දෙනු ලැබීය.

යථෝක්ත ක්ෂේත්‍රයට පිවිසීමට ප්‍රථම වයස්ගත වීම හා බැඳි විෂයානුබද්ධ න්‍යායාත්මක විග්‍රහයක් සඳහා දෙවන පරිච්ඡේදය වෙන් කල අතර එහිදී න්‍යායාත්මක ක්ෂේත්‍රය හා බැඳුනු පූර්ව අධ්‍යයනද සලකා බලනු ලැබීය. න්‍යායාත්මක විග්‍රහයේදි විශේෂයෙන් ජන සංඛ්‍යා වර්ධනයේ රටාව අධ්‍යයනය කල හැකි පොදු න්‍යායක් වන ජන විකාශන සංක්‍රාන්ති න්‍යාය හා වයස්ගත වීම පිළිබඳ ඉදිරිපත් වී ඇති සමාජ න්‍යායන් කීපයක් හඳුනා ගත හැකි විය. එම න්‍යායන් අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වූයේ ජන සංඛ්‍යාව හා සම්බන්ධ ප්‍රමාණාත්මක වෙනස්වීම් ජන විකාශන සංක්‍රාන්ති න්‍යායෙන් සලකා බැලෙන අතර වයස්ගත වීම පිළිබඳ සමාජ න්‍යායන්ගෙන් ජන සංඛ්‍යාවේ ගුණාත්මක තත්ත්වය සලකා බලන බවයි. ලෝකයේ සෙසු රටවල් ජන විකාශන සංක්‍රාන්තියේ අවස්ථාවන් පසු කල ආකාරයත් ශ්‍රී ලංකාව එම තත්ත්වයට මුහුණ දුන් ආකාරයත් පරීක්ෂා කිරීමේදී ශ්‍රී ලංකාව සංක්‍රාන්තියේ විවිධ අවස්ථාවන්ට මුහුණ දී ඇත්තේ බටහිර රටවලට වඩා වෙනස් ආකාරයටයි. බටහිර රටවල ආර්ථික සංවර්ධනයත් සමග එය ඇති වුවත් ශ්‍රී ලංකාවේ සිදුවූයේ ආර්ථික සංවර්ධනයට සමගාමීව නොව අඩු ආර්ථික සංවර්ධනයක් යටතේයි. එසේම වයස්ගත පුද්ගලයින්ගේ ගුණාත්මක තත්ත්වයන් සැලකිල්ලට බඳුන් කරන වයස්ගත වීම පිළිබද සමාජීය න්‍යායන්ගෙන් වියපත් පුද්ගලයින් එම සමාජයට හැඩගස්වන ආකාරය පිළිබඳ අදහස් ඉදිරිපත් කර තිබේ.

න්‍යායාත්මක ක්ෂේත්‍රය හා බැඳුනු පූර්ව අධ්‍යයන විමසා බැලීමේදී එම අධ්‍යයන මුලින්ම බිහි වී ඇත්තේ සංවර්ධිත රටවල් ආශ්‍රිතවයි. ඊට හේතුව වයස්ගත ජන සංඛ්‍යා ගැටළුවට ප්‍රථමයෙන්ම මුහුණ දී ඇත්තේ සංවර්ධිත රටවල් වීමයි. එහෙත් මෑත කාලීනව සංවර්ධිත රටවල පමණක් නොව සංවර්ධනය වන රටවලද ජන විද්‍යාඥයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් මෙන්ම විවිධ ආයතන මගින් ඒ ඒ රටවල අත්දැකීම් ඇසුරින් වයස්ගත ජන සංඛ්‍යාව ආශ්‍රිත අධ්‍යයන රාශියක්

කර ඇත. වයස්ගත ජන සංඛ්‍යාව නිසා එම රටවල් දැනට මුහුණ පා ඇති ගැටළු හා අනාගතයේදී මුහුණ පෑමට සිදුවේ යැයි අපේක්ෂිත ගැටළු පිළිබඳ මෙම අධ්‍යයනයන් මගින් හෙළිදරව් කරන අතර එහිදී සමාජීය හා ආර්ථික වශයෙන් ඇති වන ගැටළු කෙරෙහි මූලික අවධානය යොමු කරයි. සීග්‍රයෙන් වෙනස් වන සමාජ රටාව නිසා පාරම්පරික සාරධර්ම ක්‍රමයෙන් ගිලිහී යාම වයස්ගත පුද්ගල කණ්ඩායම ආශ්‍රිත ගැටළු උග්‍ර වීමට ප්‍රබල හේතුවක් වී ඇත. එසේම වයස්ගත ජන සංඛ්‍යාව වර්ධනය වීමත් සමග ඔවුන් සඳහා වන සමාජ සුභසාධන වියදම් වැඩි කිරීමට සිදුවීම සෑම රටකටම මුහුණ පෑමට සිදුවන තත්ත්වයක් නිසා එය එම රටවල ආර්ථික සංවර්ධනයට කිසියම් බාධාවක් වී තිබේ.

වයස්ගත වීම හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා විකාශනය පිළිබඳ කෙරුනු සාකච්ඡාවට අනුව වසර පනහක පමණ කාලයක් තුළදී ජන සංඛ්‍යාව සීග්‍රයෙන් වර්ධනය වී ඇති අතර එම වර්ධනයට ප්‍රබල දායකත්වයක් හිමි කර ඇත්තේ ස්වාභාවික වෘද්ධියයි. සීග්‍ර ජන සංඛ්‍යා වර්ධන ගැටළුව තීව්‍ර කිරීම කෙරෙහි ස්වාභාවික වෘද්ධියෙහි එක් අංශයක් වන ඉහළ සාඵල්‍යතාව බෙහෙවින් බලපා ඇත. එහෙත් 1960 ගණන්වලින් පසු ශ්‍රී ලංකාවේ සාඵල්‍යතාවය අඩු වීමේ ප්‍රවණතාවයක් දෙසට යොමු වී තිබීම නිසා මෑත කාලීනව ජන සංඛ්‍යා වර්ධන වේගය පෙර පැවති තත්වයට වඩා බෙහෙවින් අඩු වී තිබේ. උපත් පාලනයට අමතරව විවිධ ආර්ථික ප්‍රශ්න නිසාද ජනගහන වේගය අඩුවීමේ ප්‍රවණතාවයක් පවති. විශේෂයෙන් උසස් අධ්‍යාපනය වෙනුවෙන් කැප කරන කාලය දීර්ඝ වීම, විරැකියාව නිසා සමබර ආදායම් මාර්ගයක් නොමැති වීම ආදී තත්ත්වයන් යටතේ නව තරුණ පරපුරේ විවාහය කල් යන අතර එය දරු ඵල හීන වීම කෙරෙහි බලපෑම වැළැක්විය නොහැක. මේ අනුව එක් අතකින් සාඵල්‍යතාවය අඩුවීමත් අනෙක් අතින් සෞඛ්‍ය තත්ත්වයේ හිතකර ප්‍රවර්ධනයක් ඇති වීම හේතු කොට ගෙන මරණ සංඛ්‍යාව අඩු වීමත් නිසා සංඛ්‍යානමය වශයෙන් ශ්‍රී ලංකාවේ වයස් ගත වූවන් ගේ අධික වැඩි වීමක් සිදු වෙමින් පවතී.

ශ්‍රී ලංකාවේ මෑත කාලීනව රාජ්‍ය සහ රාජ්‍ය නොවන ස්වේච්ඡා සංවිධාන මගින් වයස්ගත වූවන් ගේ සුභසාධනය උදෙසා විවිධ වැඩ සටහන් දියත් කරනු දැකිය හැක. දිනෙන් දින එවැනි වැඩසටහන්වල අවශ්‍යතාවය වැඩිවන බැවින් ඒවායෙන් කෙරෙන සේවාවන්ද පුළුල් විය යුතුය. මෙවැනි සංවිධාන මගින් දැනට

දියත් කරන කාර්ය භාරයන් කවරේද යන්න සිව්වන පරිච්ඡේදයේදී සොයා බලන ලදි. සමස්තයක් වශයෙන් සලකා බලන කල්හි රාජ්‍ය අංශයේද අනුග්‍රහය ඇතිව Helpage වැනි රාජ්‍ය නොවන සංවිධාන මගින් මහඟු සේවාවක් ඉටුවන බව පෙනුන ද විශේෂයෙන් එවායෙහි පවතින මූල්‍යමය හිඟතාවය එම සේවාවන් සැපයීමේදී මහත් බාධකයක් වී ඇත. ඉදිරියේදී වර්ධනය වන වැඩිහිටි පරපුර සඳහා මෙවැනි ආයතනවලින් දැනට කරන කාර්යභාරයන් කිසිසේත් ප්‍රමාණවත් නොවේ. රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප්ද ක්‍රමයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. දැනට රාජ්‍ය අංශයෙහි ක්‍රියාත්මක විශ්‍රාම වැටුප් ක්‍රමයන්, පෞද්ගලික අංශයේ අර්ථසාධක ක්‍රමයන් වේගයෙන් මහළු වී යන ජන සංඛ්‍යාව නඩත්තු කිරීමට කිසිසේත් නොසෑහෙනු ඇත. අනෙක් අතට ආසියාකරයේ පවුල් වටිනාකම් බිඳ වැටීගෙන යන නිසාත්, මහළු පුද්ගලයින් රැක බලා ගැනීම රජයට භාර විය යුතු යැයි බොහෝ පවුල් අපේක්ෂා කරන තත්ත්වයක් ඇති වී ගෙන යන නිසාත් රජය ඒ සඳහා මං සලසා ගත යුතුව ඇත. දැනට බොහෝ දෙනා තම දිවියේ සැඳෑ සමයේදී තම පවුල්වල ආධාර උපකාර අපේක්ෂා කරන නමුත් අනාගතයේදී මේ තත්ත්වය වෙනස් විය හැකි නිසා වයස්ගත වූවන්ගේ සුභ සාධනය උදෙසා දියත් කරන වැඩ සටහන්හි දැනට වඩා වර්ධනයක් සිදුවිය යුතු බව පෙනේ.

අවසාන වශයෙන් අධ්‍යයන ගැටළුවට අදාලව රැස්කර ගන්නා ලද දත්ත උපයෝගි කොට ගෙන වයස්ගත පුද්ගලයින් ආශ්‍රිතව පැන නගින ආර්ථික ගැටළුවල ස්වභාවය ග්‍රාමීය හා නාගරික මට්ටමින් විශ්ලේෂණය කරනු ලැබූ අතර එහිදී නිගමන කීපයකට එළඹීමට හැකි විය.

# පටුන


| | |
|---|---|
| | පිටුව |
| පෙරවදන | iv |
| පටුන | vi |
| වගු පටුන | ix |
| උපග්‍රන්ථ ලේඛණය | xii |
| **1. පරිච්ඡේදය** - හැඳින්වීම | 01 |
| 1.1 අධ්‍යයනයේ පසුබිම හා කාලීන වැදගත්කම | 01 |
| 1.2 අධ්‍යයනයේ ගැටළුව හා අරමුණු | 12 |
| 1.3 පර්යේෂණ ක්‍රමවේදය හා දත්ත මූලාශ්‍ර | 13 |
| 1.3.1 දත්ත රැස්කර ගත් ක්‍රම | 13 |
| 1.3.2 නියැදිය තෝරා ගැනීම | 13 |
| 1.3.3 දත්ත විශ්ලේෂණ ක්‍රම | 14 |
| 1.4 අධ්‍යයනයේ නිර්වචන | 14 |
| 1.4.1 නාගරික අංශය | 14 |
| 1.4.2 ග්‍රාමීය අංශය | 15 |
| 1.5 අධ්‍යයනයේ සීමාවන් | 16 |
| 1.6 පරිච්ඡේද විකාශනය | 17 |
| **2. පරිච්ඡේදය** - න්‍යායාත්මක පසුබිම හා පූර්ව අධ්‍යයන | 19 |
| 2.1 න්‍යායාත්මක පසුබිම | 19 |
| 2.1.1 ජන විකාශන සංක්‍රාන්ති න්‍යාය | 19 |
| 2.1.2 වයස්ගත වීම පිළිබඳ සමාජ න්‍යායන් | 28 |
| 2.1.2.1 කාර්‍ය්‍ය වියුක්ති න්‍යාය | 29 |
| 2.1.2.2 ක්‍රියාකාරී න්‍යාය | 30 |
| 2.1.2.3 සමාජීය සබඳතා බිඳ වැටීමේ න්‍යාය | 31 |
| 2.1.2.4 වයස්ගත වීම පිළිබඳ උපසංස්කෘති න්‍යාය | 32 |

2.1.2.5 වයස්ගත පුද්ගලයින් කුඩා සමූහයක් ලෙස සලකන න්‍යාය 33

2.1.2.6 නවීකරණ න්‍යාය 34

2.1.2.7 වයස් ස්ථරායන න්‍යාය 34

2.1.2.8 හුවමාරු න්‍යාය 35

2.2 වයස්ගත වීම පිළිබඳ පූර්ව අධ්‍යයන 36

**3. පරිච්ඡේදය** - ශ්‍රී ලංකා ජන සංඛ්‍යා වර්ධනයේ ස්වභාවය සහ එහි මෑතකාලීන උපනතීන් 49

3.1 හැඳින්වීම 49

3.2 ජන සංඛ්‍යාවේ ඓතිහාසික පසුබිම 50

3.3 ජන සංඛ්‍යා වර්ධනය සහ එය තීරණය කරන සාධක 51

3.3.1 සංක්‍රමණ 54

3.3.2 මර්ත්‍යතාව 56

3.3.3 සාඵල්‍යතාව 57

3.4 ජන සංඛ්‍යාව වයස්ගත වීම 60

3.4.1 ලෝක ජන සංඛ්‍යාවේ වයස්ගත වීම 61

3.4.2 ශ්‍රී ලංකා ජන සංඛ්‍යාවේ වයස්ගත වීම 66

**4. පරිච්ඡේදය** - ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන මගින් වයස්ගත වූවන්ගේ සමාජ ආර්ථික සුරක්ෂිතතාවය උදෙසා කරනු ලබන කාර්ය භාරයන් 79

4.1 හැඳින්වීම 79

4.2 වයස්ගත වූවන්ගේ ආර්ථික හා සමාජීය ආරක්ෂාව උදෙසා රාජ්‍ය අංශයෙන් කෙරෙන කාර්ය භාරයන් 81

4.3 රාජ්‍ය නොවන ස්වේච්ඡා සංවිධාන මගින් වැඩිහිටි සුභ සාධනය උදෙසා සැලසෙන සේවාවන් 92

**5. පරිච්ඡේදය** - ජන සංඛ්‍යාව වයස්ගත වීම හා ආර්ථික ගැටළුවල ස්වභාවය 100

5.1 හැඳින්වීම 100
5.2 අධ්‍යයන ප්‍රදේශ හඳුනාගැනීම 100
5.3 අධ්‍යයන ප්‍රදේශයේ වයස්ගත වූවන් ආශ්‍රිත ආර්ථික ගැටළුවල ස්වභාවය 105
5.3.1 වයස්ගත පුද්ගලයන්ගේ වයස 105
5.3.2 වයස්ගත පුද්ගලයන්ගේ අධ්‍යාපන මට්ටම 106
5.3.3 වයස්ගත පුද්ගලයන්ගේ විවාහක තත්ත්වය 110
5.3.4 වයස්ගත පුද්ගලයන්ගේ දරුවන් සංඛ්‍යාව 112
5.3.5 වයස්ගත පුද්ගලයන්ගේ සෞඛ්‍ය තත්ත්වය 116
5.3.6 වයස්ගත පුද්ගලයන්ගේ රැකියා තත්ත්වය 119
5.3.7 වයස්ගත පුද්ගලයන්ගේ ආදායම් මාර්ග 121
5.3.8 ගෘහ කුටුම්බයේ ආදායම 125
5.3.9 වයස්ගත පුද්ගලයන්ගේ වියදම් 131
5.3.10 වයස්ගත පුද්ගලයන්ගේ ඉතිරිකිරීම් 132

**6. පරිච්ඡේදය** - සාරාංශය, නිගමන සහ යෝජනා 135

6.1 සාරාංශය 135
6.2 නිගමන 138
6.3 යෝජනා 143

ග්‍රන්ථ නාමාවලිය 147

උපග්‍රන්ථ 156